**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත
  විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 49 වන ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගැලපුම් සිදුකරන පෙර කාලපරිඡේදයට අදාල ගැලපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවත් භාර අරමුදල විසින් ගලපන ලද එකතුව | එකඟ වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| රු.3,735,852 ක් වූ පෙර කාලපරිච්ඡේදවලට අදාල ගැලපීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 25 සහ 26 ඡේද අනුව ආශ්‍රිත සමාගම් සමඟ සිදු කරනු ලබන සියළුම ගනුදෙනු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවත් අරමුදල එහි ආශ්‍රිත සමාගම් වූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 4.1.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වටිනාකම රු. 5,586,821,233 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි. | එකඟ වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම සමාගම් 2020 වර්ෂය පුරාම ක්‍රියාකාරීත්වයක් නොවූ බැවින් 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල නොකරන ලදී. නමුත් එම සමාගම් දෙකෙහි ඒකාබද්ධ ගිණුම් 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පිළියෙල කිරීමට විගණන ආයතනයකට භාර දී ඇති අතර එම ඒකාබද්ධ ගිණුම් සම්පූර්ණ කල වහාම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2005 වර්ෂයේදී රු. 12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි. තවද භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු. 1,064,520,695 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මාලබේ පිහිටි SLIIT ආයතනය ඉදිකිරීම සඳහා රු.මි.373 ක මුදලක් වැය කල අතර 2015.12.31 දිනට SLIIT ආයතනයේ ගිණුමේ තිබූ ශුද්ධ වත්කම් වටිනාකම ( ඉඩම, ගොඩනැගිලි උපකරණ ) ගිණුම් පොත්වලට ගෙන ඇති අතර SLIIT ආයතනය මහපොළ සතු වත්කමක් බැවින් මෙලෙස ගිණුම් ගත කොට ඇත. SLIIT ආයතනයේ සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම SLIIT ආයතනය විසින් ලබාදී නොමැති බැවින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කොට ගිණුම් පොත්වලට ගැනීම සමාලෝචිත වර්ෂය තුලදී නොහැකි වී ඇත. | ඉඩම තක්සේරු කර පොත්වලට ගත යුතුය. |
| (ඇ) | 2021 මාර්තු 17 දිනැති ජනාධිපති අරමුදලේ අංක PS/PA/5/36/vol-iv/2021 දරන ලිපිය අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට සමාලෝචිත වර්ෂයට අදාල ලාභ කොටස රු. 1,305,156,751.50 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු. 1,262,598,395 ලෙස දැක්වීම නිසා රු. 42,558,356 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කරන අවස්ථාවේදී ශේෂ තහවුරු කිරීම් ජනාධිපති අරමුදල මඟින් ඉල්ලා සිටියත් එම ශේෂ තහවුරුව 2021 මාර්තු 17 දිනැති ලිපිය අනුව 2021 මාර්තු 25 දින ලැබී ඇත. ඒ අනුව මහපොළ අරමුදල අවසන් ගිණුම් පිළියෙල කොට විගණනය සඳහා භාරදී තිබුණි. කෙසේ වෙතත් මෙම ශේෂ තහවුරු ලිපියට අනුව අදාල ගැලපීම් 2021 වර්ෂයේ දී සිදුකරනු ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ජනාධිපති අරමුදලින් දන්වා එවා තිබූ පරිදි 2020 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු හිඟ ලාභ කොටස රු.262,149,615 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 109,302,245 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 152,847,370 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු හිඟ ලාභ කොටස නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම රු. 296,318,766 ක් වුවද භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන වල රු. 287,876,625ක් ලෙස දක්වා තිබීමෙන් රු. 8,442,141 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පතු ආදායම රු.296,318.766 නිවැරදි නොවන අතර දැනට ගිණුම් ගත කර ඇති රු.287,876,625 නිවැරදි වේ. | ස්ථාවර තැන්පතු පොළී නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු. 3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ගෙන නොතිබුණි. | මෙම පාසැල් සංවර්ධන කටයුතුවල ඉදිකිරීම් සතොස ආයතනය යටතේ පිහිටුවා තිබූ සමාගමක් මඟින් සිදුකල අතර සියලු බිල්පත් නිරවුල් කිරීම් එම ආයතනය හරහා සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවිය යුතු ලෙස දක්වා ඇති රු.3,832,875 පියවීමට අදාල බිල්පත් හා කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් මෙතෙක් ඉදිරිපත් කොට නැත. ඒ අනුව මෙම බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාද වී ඇත. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදල් කළඹ සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීම භාර අරමුදලේ ආයෝජන කමිටුව විසින් සිදු කරනු ලබන නමුත් සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධ ගාස්තු වශයෙන් ලංකා බැංකුව වෙත රු. 2,592,000 ක අධික වියදමක් දරා තිබූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මුදල් ගෙවීමකින් තොරව එම සහසුකම් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත | නිසි පරිදි මුදල් කළමනාකරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම් සම්බන්ධයෙන් වර්තමාන වටිනාකම් ගණනය කිරීම සඳහා විගණනයක් පෞද්ගලික ආයතනයක් ලවා සිදුකර තිබුණි. ඒ සඳහා ගාස්තු වශයෙන් රු. 3,769,451 ක් ද, නීති ගාස්තු රු. 1,744,249 ක් සහ ඇවරකිරීමේ ගාස්තු රු. 60,000 ක් ද එම සමාගම විසින් ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී භාර අරමුදල විසින් ගෙවා තිබුණි. තවද අරමුදල විසින් එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එම සමාගම් ගිණුම්වල ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | කලින් සමාගම් විකිණීමට තීරණය කර තිබූ බැවින් එවැනි විගණනයක් සිදු කරන ලදී. | එම වියදම් එම ආයතනවලින් දැරිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,085,347,967 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 755,972,796 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 329,375,171 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංවර්ධන ලොතරැයි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 265,251,785 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------- | -------------------- | ------------ |
| 2016 සැප්තැම්බර් 15 දින අවලංගු කර තිබූ මාර්ග ගත ලොතරැයිය සම්බන්ධයෙන් ඕගනික් ගේම් පෞද්ගලික සමාගමෙන් රු. මිලියන 791 ලැබිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේදී නීති උපදේශක ගාස්තු ලෙස රු 2,344,514 ක් ගෙවා තිබුණි. | එම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී. නඩු කටයුතු අවසන් වී නැත. සමාලෝචිත වර්ෂයේ නීති උපදේශක ගාස්තුව මෙමගින් දැක්වේ. | කඩිනමින නඩු කටයුතු අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් ) සීමිත සමාගම (SLIIT) සමග 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹී ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබූ අතර 2015 එළඹී ගිවිසුම නීත්‍යානුකූල නොවන බවට විමර්ෂණයක් අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිසමේ විභාග වෙමින් පවතී. තවද ජනාධිපති විශේෂ විමර්ෂණ කොමිෂන් සභාව යටතේ ඒ සම්බන්ධයෙන් පැවති විමර්ෂණය අවසන් වී එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ලබා දී තිබූ අතර 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ප්‍රකාශ කර තිබූ පරිදි තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් මහපොළ භාර අරමුදලට ඇති අයිතිය සම්බන්ධයෙන් වාර්තාවක් ද පාර්ලිමේන්තුවේ විවාදයක් සඳහා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පිහිටි මහපොළ භාර අරමුදලට අයත් භූමියේ වර්තමාන වටිනාකම තක්සේරු කර ගැනීමට නොහැකි වී ඇති අතර SLIIT ආයතනයේ වර්තමාන පාලක මණ්ඩලය සාකච්ඡාවක් සඳහා කැඳවා තිබුණත් ඔවුන් විසින් ඊට සහභාගී වීම ප්‍රතික්ෂේප කරන බව ලිඛිතව දන්වා එවා තිබුණි. | එකඟ වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ආ)මහපොළ භාර අරමුදලට රු. 985,500,070 ක කොටස් ප්‍රාග්ධනයක් හිමි නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ එහි උප සමාගමක් වූ මහ බැංකුවේ ප්‍රාථමික ගැණුම්කරුවකු ලෙස කටයුතු කල නැට්වෙලත් සෙකියුරිටීස් සමාගම දිගින් දිගටම අලාභ ලබන තත්වයක් පැවතීම මත ඇවර කලයුතු බව 2020 නොවැම්බර් 03 දිනැති අංක අමප/20/1367/313/011 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් තීරණය කර තිබුණි. ඒ අනුව 2021 පෙබරවාරි 28 දින සේවකයින්ගේ සේවය අවසන් කර නියමිත වන්දි මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවත් 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරකසභාවේ නිර්දේශය වූයේ සමාගම් සම්බන්ධයෙන් අධිකරණවල ඇති නඩු සහ | එකඟ වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | |
|---|---|---|
| අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වංචා දූෂණ සම්බන්ධයෙන් ඇති පැමිණිලි විභාග අවසන් වන තෙක් සමාගම් ඈවර කිරීම තාවකාලිකව නවත් වන ලෙසය. එහිදී භාරකාර මණ්ඩලයේ හා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඈවර කිරීමේ අනෙකුත් කටයුතුවලට බාධාවක් නොවන බව සඳහන් කරන ලදී. ඒ අනුව ඈවරකරුවකු පත්කිරීමේ කාර්ය නවතා තිබුණි. | | |
| (ඇ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් සියයට 60 ක් භාර අරමුදලට ලබා ගැනීමටත් ලාභ කොටස සෘජුව මහපොළ අරමුදලට ලබා ගැනීමටත් අදාලව සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කිරීමට සහ මහපොළ නමින් මුද්‍රිත ලොතරැයියක් ආරම්භ කිරීමට හා සුපිරි වෙළඳසැලවල් හා ස.තො.ස. වෙළඳසැල් නියෝජිත ආයතන ලෙස පත්කිරීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණ ද එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල්, ඩයලොග් සමාගම් එක්ව එම ආයතන නියෝජිත ආයතන ලෙස පත් කරමින් මාර්ගගත ලොතරැයියක් ආරම්භ කර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පරිගණක ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ නමුත් එවැන්නක් සිදු කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඉ)දේශීය හා විදේශීය ශිෂ්‍යත්වලාභීන්ට ඔවුන්ගේ ආධාර මුදල් සෘජුව භාර අරමුදලට ලබාදිය හැකි මාර්ගස්ථ ගෙවීම් ක්‍රමයක් ඇති කරන බව සැලැස්මේ සඳහන් කර තිබුණද එසේ කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) දානපතියකු විසින් කරනු ලබන දායකත්වයක් මත ශිෂ්‍යත්ව අරමුදලක් හෝ පොදු කැපකරු ශිෂ්‍යත්ව අරමුදල් පිහිටුවීම මගින් විශ්ව විද්‍යාල නොවන උසස් අධ්‍යාපන ආයතනවල ඉගනුම ලබන අඩු ආදායම්ලාභී සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණ ද එසේ සිදු කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් භාර අරමුදල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී මහපොළ අරමුදලේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව සැලැස්මක් සකස් කරමින් ඉදිරිපත් කරනු ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය කළ යුතුය |